# කෘෂි ව්‍යාප්තිය හා ගොවියා

ඩබ්. සී. දයාරත්න.

පර්යේෂණවලින් ලැබෙන ප්‍රතිඵල ප්‍රායෝගිකව යොදගැනීම හෙවත් ව්‍යාප්තිය බැලූ බැල්මට සරළ ක්‍රියාවක් සේ පෙනුනද, මුල් තැන දිය යුතු දැ පටලවාගැනීමෙන් මෙය ඉතා සංකීර්ණ බවට පත් විය හැකිය, නැතිනම් අප භාවිතයට ලක් විය හැකිය. කෘෂිකර්මයේ සංවර්ධනය උදෙසා කළ කටයුතු සම්බන්ධයෙන් මෙම රටට දිගු ඉතිහාසයක් ඇත. මෙවැනි සංවර්ධන කටයුතු මුහුදු සංචාරය පවා එතරම් දියුණු නොවී තිබුණු කාලය දක්වා තරම් ඈතට දිව යයි. එහෙත්, දූරස්ථ රටවලට විකිණිය හැකි වූ හෝ අගනා නිෂ්පාදන එකල අපට තිබිණි. විදේශකයින් මෙරටට පැමිණියේ මැණික් මිළ දී ගැනීම සඳහාම පමණක් නොවේ; ඔවුහු කුළුබඩු, තෙල් සහ වෙනත් නිෂ්පාදනද මිළට ගත්තෝය.

කෘෂි සංවර්ධනය අංශවලට බෙදු පාළනය කිරීමේ ආරම්භයත් සමගම බොහෝ භෝගයන් පිළිබඳ වගකීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් භාර ගැනිණි. පසුව; සාමාන්‍ය විද්‍යාව යන විෂයය එහි ශුද්ධ විෂයයන්ට බිඳෙන්නාක් මෙන්, කෘෂි සංවර්ධනය යන විෂයයද බිඳී එහි යම් යම් කටයුතු යම් යම් සංවිධානවලට භාර වීමට තුඩු දුන්නාක් මෙන් පෙනුණු වෙනස් වීම, ක්‍රමයෙන්, ඇති විය. මේ හේතු කොට ගෙන පැරණි ඒවා වෙනුවට නව ඒකක තැනිණි. සමහර විට, එකම කටයුත්ත දෙතුන් පොළකින් ඉටු කිරීමද, මේ නිසා සිදු විණි. පැරණි ක්‍රම ප්‍රමාණවත් ලෙස පාවිච්චි නූනා විය හැකිය, නැති නම් ප්‍රමාණවත් නූනා විය හැකිය, නැතිනම් ඒවායේ පැවැත්මට අවශ්‍යවූ ප්‍රයෝජනවත්කමින් කොටසක් නැති වූවා විය හැකිය, එසේද නැතිනම් රටෙහි සිදුවන වෙනස් වීම් සමග කරට කර සිටීමට සුදුසු තරම් වේගයෙන් අනුවර්තනය වීමට ඒවා නොපොහොසත් වූවා විය හැකිය. නිදසුනක් හැටියට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂි සංවර්ධන අධිකාරිය, කෘෂි සේවා දෙපාර්තමේන්තුව සහ වාරි මාර්ග දෙපාර්තමේන්තුව යන ඒවා ගනිමු. ඒ එකිනෙක තමන්ට අදල අංශය පිළිබඳව විශේෂත්වයක් දක්වයි. එහෙත්, ඒවා ක්‍රියා කරනුයේ සම්පූර්ණ කෘෂි පද්ධතියේ වැදගත් අවයව ලෙසිනි. තේ, රබර් හා පොල් උපදේශක සේවාද අපට ඇත. ඊ ළඟට, ග්‍රාමීය වගා නිලධරයන්ද සිටි නමුත් ඔවුන්ව මෑතකදී ග්‍රාම සේවා නිලධරයින්ගේ සේවයට බඳවා ගැනිණි.

කෘෂිකාර්මික නිපැයුම් බොහෝවක් තවමත් නිපැදවීමට සමත් මෙම රටෙහි වැදගත්ම ස්වාභාවික සම්පත දියුණු කිරීමෙහිලාද, සංවර්ධනය කිරීමෙහිලාද ඒ සියලු සංවිධාන බෙහෙවින් උත්සහ දරමින් සිටියි. සමහර, පැහැදිලිව පෙනෙන දුෂ්කරතා නම් පැනෙන් හෝ

එළදායී සරල තීරණ මගින් හෝ නිරාකරනය කළ හැකිය. බොහෝ ගැටළු බරපතල ඒවා සේ දිස් වන නමුදු හැම විටම පොදු යහපත යන අධිෂ්ඨානයෙන් යුතුව කාලීන පියවර ගැනීමෙන් ඒවායේ විසඳුම් සරල බවට පත්වේ.

වන විනාශයෙන් හා වෙනත් පාරිසරික පරිහානීන් ගෙන් පසුද අපට තවමත් ඉතිරිවී තිබෙන දේශගුණ තත්ත්වය අනුව පෙනී යන්නේ අපේ පස, තුරුලතාදිය හා ජලය යන සම්පත් නිවැරදි ලෙස පරිහරණය කිරීමෙන්, වේගයෙන් දුබල වී ගෙන යන රටේ ආර්ථිකයට පුනර්ජීවයක් දිය හැකි බවයි. කෘෂිකර්මය, කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත සහ උගත් නූගත් තරුණ පිරිස්වලට රැකියා අවස්ථා වැනි අනෙකුත් සබැඳි අංශයන් කෙරෙහිද මෙයින් නිසැකවම යහපතක් වන්නේය.

විවිධ භෝග වැවීම සඳහා අපට යථා සැලැස්මක් ඇති බවක් නොපෙනේ. එවැන්නක් තිබුණා, වුවත් එය හරිහැටි ක්‍රියාත්මක නොවනවා විය හැකිය. මේ නිසා; විවිධ පස් වර්ග සහ ඒවාට අදාල පරිසර තත්ත්ව අනුව භෝග තේරීමක් අවශ්‍යය. මෙසේ කළ හොත්, නුවරඑළිය වැව, ගංගා හා අනෙකුත් ජල සම්පත් මෙතරම් ශීඝ්‍රයෙන් ගොඩ වීමක් නොසිදු වනු ඇත. ගොවියාට ප්‍රමාණවත් උපදෙස් දී නොමැත. එසේ නොවීණි නම් හානියෙන් වැඩි කොටසක් වලක්වාලීමට ඉඩ තිබිණි. වවන්නාට නිවැරදි දැනුම ලබා දුන්නා නම්, රත්නපුර වැනි පෙදෙස්හි ජල උල්පත් සියල්ලම හෝ ඉන් බොහොමක්වත් හෝ තවමත් උතුරවමින් තිබෙන්නට ඉඩ තිබිණි. මෙම රටෙහි ගොවීහු තවමත් මූලික ගැටළු ගැන කණස්සලු වෙති. ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් අළුත් බෝග නිසා අතරමං වෙති. වර්ෂ 1970 ගණන් තුළදී කළුතර දිස්ත්‍රික්කයේ මතුගම, හෙවැස්ස හා බදුරලිය වැනි පළාත්වල ප්‍රධාන ආදයම් මාර්ගයක් බවට වැල් දෙඩම (පැෂන් ෆ්‍රුට්) පත් විය. එහෙත්, වැඩි කල් නොගොසින්ම ඉන් සමහර පලාත් කිසිම භෝගයකට නුසුදුසු මුඩු ඉඩම් බවට හැරිණි. හොඳින් දැනුවත් නොවූ ගොවියා පස ප්‍රයෝජනයට ගන්නා අයුරුද පස පාලනය කරන අයුරුද දක්වෙන හොඳ නිදසුනකි ඒ. පළිබෝධයන්, රෝග සහ පොහොර භාවිතය යන කරුණු පිළිබඳව ප්‍රමාණවත් නොවන තොරතුරු වැනි ගැටළු සමග කෘෂි උපකරණ ගැන මනා අවබෝධයක් නොතිබීම අත්වැල් බැඳ ගැනීමෙන්ද ගොවියා දුෂ්කරතාවට පත්වෙයි. අලෙවිය සම්බන්ධයෙන්ද ගොවියාට ආධාර වීමට අවශ්‍ය බලය කෘෂි ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සතුව තිබිය යුතුය. ගොවියාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ඥාණය කෘෂි ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් ලබා ගැනීමද කළ යුතුය.

කොළඹ පැවති ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගම් දේශනයකදී කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ගොවියාගේ නොදැනුම ඉස්මතු කොට පෙන්වන ලදී. මේ එළවළු භෝග සම්බන්ධයෙනි. වගා බිමේ සිට නිෂ්පාදන අලෙවි කැරෙන තැන දක්වා කෘමි නාශක යෙදුම ඇදී තිබෙන ආකාරය පිළිබඳ තම සොයාගැනීම් රුහුණු විශ්ව විද්‍යාලයෙන් පැමිණි දේශකයා හෙළි කළේය.

මෙය ඉතාම අන්තරාදයක තත්ත්වයකි. තමා විසින් මෑත දී රසායන ද්‍රව්‍ය යොදන ලද භෝගයෙන් කොටසක් තමාගේම ආහාරය වන බවත්, එය තමාගේම පරිභෝජනය සඳහා ලිපෙහි තැම්බෙමින් ඇති බවත් වෙළෙන්දද නොදනී. පළිබෝධ නාශනය උදෙසා වන සමහර රසායන ද්‍රව්‍ය ගොවියා විසින් මිළදී ගැනෙනුයේ ඒවා අලෙවි කරන වෙළෙන්දගේ මරකමදරුව අනුවයි. ඒ

දෙදෙනාටම ලේඛලයේ ඇති විස්තර නොතේරෙනවාද විය හැකිය. ආහාරයට ගැනෙන භෝග සඳහා නිර්දේශ නොකැරෙන විශේෂ පළිබෝධ නාශක වැනි අධික ලෙස විෂ සහිත ද්‍රව්‍ය ගොවියා විසින් මිළට ගනු ලබන්නේ මේනිසාය. අපභාවිතයට ලක්වීම නිසා මෙවැනි සමහර රසායනික ද්‍රව්‍ය තහනම් වී ඇතද යම් විශේෂ කෘත්‍ය සඳහා ඒවායින් ප්‍රයෝජන නැතුවා නොවේ.

කාර්යාලයීය කරුණු පිළිබඳව තමාට ඇති දැනුම මත, සමහර විට, ගොවියාගේ පැවැත්ම රඳා පවතී. මෙය විශේෂයෙන් බලපානුයේ ගොවියාගේ ඉඩම ආරවුල් සහිත වූ විට නැති නම් රජයේ ආධාර මුදල්, බැංකු හෝ වෙනත් දයක ආයතන මත ගොවියා යැපෙනවිටය. නොමිළයේ දෙන ප්‍රදාන ලෙසින් හෝ ආධාර ලෙසින් සැපයෙන ද්‍රව්‍ය පිළිබඳව තීරණය කැරෙනුයේ රාජ්‍ය ප්‍රතිපත්ති විසිනි. එවැනි ආධාර දෙන විට හෝ දෙන අතර හෝ සම්මතයන් හා කොන්දේසි අවශ්‍යය. ආර්ථික වශයෙන් ඉතා පසුබා සිටින සමහර ආදයකයෝ ආධාරමය ලෙසින් හෝ නොමිළයේ හෝ දෙන ප්‍රදන මහත් සේ අපේක්ෂා කරති. යම්ක් කමක් ඇති ගොවීහු පවා, බොහෝ විට. මෙවැනි අධාර බලාපොරොත්තු වෙති. අපේක්ෂිත ද්‍රව්‍ය හෝ මුදල් හෝ ලැබෙන තුරු බලා සිටින එවැනි ගොවීහු පොහොර යෙදීම. වල් නෙළීම යනාදී වැදගත් අවශ්‍යතා නොසලකා හරිති. තමන් විසින්ම එමකාර්යයන් ඉටු කරගෙන දීර්ඝකාලීන ලාභ ලැබෙන යේ වගා බිම දියුණු කිරීමට පුළුවන්කම ඇතත් ඔවුහු එසේ නොකොට ආධාර ලැබෙන තුරු නිකම් බලා සිටිති. මෙය ලේඛකයා විසින් මැනැවින් දක්නා ලද කරුණකි. රාජ්‍ය ආධාර ගෙවීම සම්බන්ධ ප්‍රමාදයන්, සමහර විට, තීරණාත්මක ලෙසින් දීර්ඝ වේ. මීට බොහෝ විට හේතු විය හැකියේ ප්‍රවාහන පහසුකම් නොමැති වීම හෝ වැරදි පරිහරනය වළක්වාගැනීමේ ක්‍රියා මාර්ග සඳහාවන ප්‍රමාදයන් හෝය. එවැනි තත්ත්වයන් නිවැරදි කිරීමේ විසඳුම් පහසුවෙන්ම සලසා ගත හැකිය. ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ඉතාම ප්‍රයෝජනවත් වනුයේ මෙතනදීය. ඔවුන් ගොවියාව දැනුවත් කළ යුතුය. කලට වේලාවට කටයුතු කර භෝගයේ වැදගත් අවශ්‍යතා සපයා දෙන්නේ කෙසේ දැයි කියා ගොවි මනස පෝෂණය කළ යුතුය. මන්ද යත්. කලට වේලාවට තම අවශ්‍යතා බලාපොරොත්තු වෙනවා හැර, රාජකාරිමය කටයුතු හෝ දේශපාලනමය තර්ක විතර්ක හෝ තේරුම් ගැනීමට පුළුවන්කමක් පැලැටිවලට නැති බැවිනි.

ප්‍රමාදවී ලැබෙන සමහර අධාර අතිරේක සැපයුම් ලෙස පසුව යොදගැනීමට හැකි බව ගොවියාට අවබෝධ කිරීමද අවශ්‍යවේ. එවන් අවස්ථා වලදී ගොවියාට අනදී ඔහු තුළ **ආත්ම විශ්වාසයක්** ජනිත කළ යුතුය. වගාවට සැපයිය යුතු දෙයින් (ප්‍රදානයෙන්) කොටසක්වත් මිළ දී ගැනීමට ගොවීන්ගෙන් බොහෝ දෙනෙක් සමත්ය. එසේම, ශාක පෝෂණයේ හෝ ජල ඌණතාවයේ හෝ තීරණාත්මක තත්ත්වයන් වළකින සේ යමක් සැපයීමට ද ඔවුනට පුළුවන. පිනට ලැබෙන දේ සඳහා බලා සිටිමින් කිසිත් නොකරනුවාට වඩා එවැනි යමක් කිරීම මනාය අන් කිසිම හේතුවක් නිසා නොව, නිකම්ම අනපසු වීම නිසා යම් ආධාර නොලද අසරණ ඉඩම් හිමියන්, රාජකාරි කටයුතු වලදී, ලේඛකයාට මුණගැසී ඇත. නොසලකා හැරීමටද හේතුව නොදැනුවත්කමයි. කාර්යාලයීය ලේඛණවලට පූර්ව අවශ්‍යතාවක් වන ආදායකයාගේ නමට බැංකු ගිණුමක් විවෘත කිරීමට බැරි වීම එවැනි නොසලකා

හැරීමකි. මීටත් වඩා මූලික වූ අවශ්‍යතාද සමහරු නොසලකා හරිති. සමහරු, බොහෝ විට, ප්‍රමාදයට කරුණු විමසති. එහෙත්, ඔවුනට නිවැරදි තොරතුරු නොලැබේ. රාජකාරීමය සහයෝගය සහ අධ්‍යාපනය ව්‍යාප්ති සේවයේ අංගයකි. අනෙකුත් ප්‍රදාන සමග මෙයද, නියම වේලාවට, එකට යායුතුය.

නිර්දේශයන් පිළිගැනීම සඳහා ගම්බද ගොවියාට විද්‍යාත්මක විස්තර අනවශ්‍ය යැයි යන මතය හැමවිටම සත්‍ය නොවේ. භෝග කළමණාකරනයෙහිදී තමන් විසින් කෙරෙනු ලැබිය යුතුව ඇත්තේ කුමක්දැයි කියා වටහා ගැනීමට අවශ්‍ය වන න්‍යායයන් දුරවබෝධ වන ගොවීන් සිටිනම් ඒ අල්පයකි. වැදගත් වනුයේ විෂය කරුණු හඳුන්වා දෙන ආකාරයයි. තේරුම්ගැනීමට දුෂ්කර වන විෂයයක් විස්තර කිරීමට හෝ පෙන්වාදීමට හෝ තෝරාගැනෙන නිදර්ශනයේ ස්වාභාවය ඊටත් වඩා වැදගත්ය. විද්‍යාත්මක විස්තර කිරීම, බොහෝ විට, ගොවියාගේ අත්දැකීම් සමග හැලපේ. තම මුතුන් මිත්තන්ගෙන් ලැබුණා වුවද තමන් විසින් දැකගත් ප්‍රතිඵලවලින් හා ප්‍රයත්නවලින් ලැබුණුවද ගොවියා සතු සත්‍ය දැනුම් සම්භාරය එයයි. සරල විද්‍යාත්මක විස්තර කිරීම් වලට සියලු ගොවීන් සවන් දෙන බව ලේඛකයාට දැනගැනීමට ලැබී ඇත. බුද්ධිමත්, දැනුමක් ඇති වැවිලිකරුවන් ලෙස තමන්ව පිළිගනු ලැබීමට ලක්වීමට ඔවුහු කැමති වෙත්.

සමහර විට නොමිලයේද තවත් විටක ආධාර ලෙසින්ද ප්‍රදන සැපයුම ප්‍රධාන පෙළේ ජනප්‍රිය දෙයක් බවට පත්ව ඇත. කළින්ද සඳහන් කළ පරිදි, පොහොර හා සිටුවුම් ද්‍රව්‍ය වැනි තීරනාත්මක වැදගත්කමක් ඇති දේවල් පවා ලැබෙන තුරු බලා සිටීමට ගොවීහු පෙළැඹෙති.

එවැනි ප්‍රදනයන්ට පහත් කැන් ලැබෙන අවස්ථා උපදේශකයින්ට හමුවී ඇත. නැවත පැළ ලබාගැනීම පහසු දෙයක් බව ගොවියාට හැඟෙන බැවින්, පැළ මැරියාම හෝ පැළ බාල වීම හෝ බරපතළසේ නොසැලකේ. තමාට වැරදුනතැන කුමක් දැයි අවබෝධ වන පරිදි ගොවියා දැනුවත් කළ යුතුය. එසේම, දයකශාගේ තත්ත්වය, එක් එක් ලක්ෂ්‍යයන්හිදී දැරීමට සිදුවන වියදම සහ තෝරාගත් ද්‍රව්‍යයන් ගේ වටිනාකම යනාදී කරුණු පිළිබඳවද ඔහුව දැනුවත් කළ යුතුය. ප්‍රදනයන් සොයාගෙන සපයාගැනීමේ කාර්යය සඳහා ගොවියා සහභාගී වීමද ඒ වගකීමට ඔහු හවුල් වීමද මෙතැනදී වැදගත් වේ. භාවිත කෙරෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් වඩා ප්‍රවේශමකාරී වීමට මෙවැනි වගකීමක් පුද්ගලයාට අධාරකාරී වෙයි. ගොවියා වෙත ළඟා වී තාත්වික ප්‍රතිඵල බිහි කිරීමේ සාර්ථකත්වය රඳා පවත්නේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ අවංකභාවය මතයි. මානුෂික ප්‍රශ්න ඇතුළු විවිධ ප්‍රශ්න තේරුම්ගැනීම සඳහා අවශ්‍ය වන ඉවසීමේ ගුණාංගයද ඔවුනට තිබිය යුතුය. ව්‍යාප්ති කාර්යයට ඇප කැප වීම සමාජීය යුතුකමක් සේ සැළකිය යුතුය. ඒ මන්ද යත්, ජීවන සටනින් ජය ගැනීමටත් ඒ අනුසාරයෙන් රටෙහි ආර්ථිකයට යම්තමින් හෝ උර දීමටත් අවශ්‍ය දැනුම හා ද්‍රව්‍ය අපේක්ෂා කරන පිරිසකට උපකාර කිරීමක් ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ කටයුතුවලින් ඉටු වන බැවිනි. ගොවියාගේ විශ්වාසය දිනාගැනීම ඉතාම වැදගත්ය. තමන්ට ගැටෙන්නට සිදුවන විෂයයන් ගැන හොඳින් කියවා දැනුවත්වී සිටින ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට මෙය ඉතා පහසුය. හොඳ ව්‍යාප්ති නිළධරයෙකු වීමට නම්, භෝග ආරක්ෂා කිරීම, වගා කිරීමේ ක්‍රම සහ වෙනත් බොහෝ කරුණු පිළිබඳ නවතම දැනුම අවශ්‍යය.

අවස්ථාවන්ට මුහුණ දීමේදී තුළනාත්මකව පහසු විධි මෙන්ම ඒවා ඉටු කරගැනීමේ කඩිනම් එහෙත් මිළාධික නොවූ ක්‍රම පිළිබඳ අවබෝධයක් තිබීම ව්‍යාප්ති නිළධරයා ගේ දැනුමේ වැදගත් අංගයකි. කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නියැලෙන මිනිසුන් වර්ග විවිධ. විය හැකිය. එහෙත්, ඒ තරමම විශාල විවිධත්වයක් නොවේ. භාරකරුවන් මාර්ගයෙන් තම ඉඩම් පාලනය කරවන ඉඩම් හිමියෝ, බොහෝ විට, තම ඉඩමෙහිම පදිංචිව සිටින ඉඩම් හිමියාගේන් වෙනස් වෙති. එබැවින්, තමා නියැළෙන හෝ තම වගකිව යුතු හෝ භෝගවල දියුණුව සම්බන්ධයෙන් පුළුල් දැනුමක් ව්‍යාප්ති නිලධරයාට තිබිය යුතුය.

දවසේ මෙහෙය හමාර වීමෙන් පසු, තමා කෙරේ බලාපොරොත්තු තබා ඇති යම් පුද්ගලයෙකුගේ පැවැත්ම උදෙසා තමා අර්ථවත් ලෙස දායක වූ බව ව්‍යාප්ති නිළධරයාට හැඟී ගිය යුතුය. මෙවැනි නිළධාරීහු වඩ වඩා ගොවීන් වෙත ළඟා වෙති. ගොවීහුද ඔහු සමීපයේ රැඳී සිටිති.

මුද්‍රණය : ඉම්පැක්ට් ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්
නො: 8,
ජූඩ පාර,
නාගොඩ,
කළුතර.